ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1553/10 - 2008 ජුනි 10 වැනි අඟහරුවාදා - 2008.06.10

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

ආණ්ඩුවේ නිවේදන

විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය

ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති ප්‍රතිපත්තිය හා උපාය මාර්ග

ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති ක්ෂේත්‍රය සම්බන්ධයෙන් සකස්කර රජයේ අනුමැතිය ලබා ගන්නා ලද පහත උපලේඛනයේ සඳහන් ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති ප්‍රතිපත්තිය හා උපාය මාර්ග විදුලිබල හා බලශක්ති අමාත්‍ය ඩබ්. ඩී. ජේ. සෙනෙවිරත්න වන මම මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රසිද්ධ කරමි.

ඩබ්. ඩී. ජේ. සෙනෙවිරත්න,
විදුලිබල හා බලශක්ති අමාත්‍ය.

2008 මැයි මස 11 වැනි දින.

ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති ප්‍රතිපත්තිය සහ උපාය මාර්ග

විදුලබල හා බලශක්ති අමාත්‍යාංශය - ශ්‍රී ලංකා රජය

ශ්‍රී ලංකාවේ බලශක්ති අංශය මුහුණ පා ඇති අභියෝගයන් බොහෝය. අඛණ්ඩ විදුලිබල සැපයුමක් හා ඛණිජ තෙල් නිෂ්පාදන සැපයුමක් සහතික කරමින් දේශීය බලශක්ති සම්පත් හා ආනයනික පාෂාණිභූත ඉන්ධන අතර උපායමාර්ගික සමතුලිතතාවයක් පවත්වා ගැනීමට වර්ධනය වන ආර්ථිකයට සිදු වේ. ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් හතරෙන් එකක් වෙත තමවත් ගෘහමය අවශ්‍යතා සඳහා විදුලිබලය ලබාදිය යුතුව ඇත. වාණිජ බලශක්ති උපයෝගිතා ආයතනයන්හි මූල්‍යමය ශක්‍යතාවය හා සේවා ගුණාත්මකභාවය වර්ධනය කිරීම සඳහා තවදුරටත් ඒවා ශක්තිමත් කළ යුතුව තිබේ. බලශක්ති සේවාවන්හි ආයෝජනය, මෙහෙයවීම, නියාමනය හා බෙදාහැරීම සම්බන්ධයෙන් රටේ ජනතාවගේ දායකත්වය වැඩි කළ යුතුය.

මෙම ලේඛනයෙන් ශ්‍රී ලංකාවේ බලශක්ති ප්‍රතිපත්තිය ප්‍රකාශ කෙරෙන අතර ශ්‍රී ලංකා රජය සහ එහි ජනතාව සිය සහශ්‍ර සංවර්ධන ඉලක්කයන් සපුරා ගැනීමට හැකි වන පරිදි බලශක්ති අංශය සංවර්ධනය හා කළමනාකරණය කර ගැනීමට ඉදිරි වර්ෂවලදී කටයුතු කරන ආකාරය හා අදාළ ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ග, නිශ්චිත ඉලක්ක හා කඩඉම් පිළිබඳව ද පැහැදිලි කෙරේ. ජනතාවගෙන් විශාල කොටසකට දැරිය හැකි මිලකට බලශක්ති සේවා සැපයීම පුළුල් කිරීමට, බලශක්ති අංශයේ සැලසුම්කරණය, කළමනාකරණය හා නියාමනය ප්‍රවර්ධනය කිරීමට සහ වාණිජ බලශක්තියේ වැදගත් සම්පතක් ලෙස ජෛවස්කන්ධ සඳහා නව ජීවයක් ලබාදීමට නිශ්චිත නව ආරම්භයන් මෙම ප්‍රතිපත්තියෙහි ඇතුළත් වේ.

නිශ්චිත ඉලක්කයන් වෙත ළඟාවීම සඳහා වන එක් එක් ප්‍රතිපත්ති මූලිකාංගය සහ ඒ හා සම්බන්ධ උපායමාර්ග ක්‍රියාත්මක කිරීමේ ආයතනික වගකීම් ද මෙම ලේඛනයෙහි දක්වා තිබේ. මෙම ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති ප්‍රතිපත්තිය සහ උපායමාර්ග ප්‍රකාශයට පත්කිරීමට පෙර එහි කෙටුම්පත සම්බන්ධයෙන් කොටස්කරුවන් විශාල පිරිසක් සමග සාකච්ඡා කොට හා මහජනතාවගේ අදහස් ලබාගෙන අවශ්‍ය සංශෝධනයන් සිදුකොට තිබේ.

මෙම ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති ප්‍රතිපත්තිය සහ උපායමාර්ග වර්ෂ තුනක කාලයකට පසු සමාලෝචනය කර සංශෝධනය කරනු ලැබේ.

1. හැඳින්වීම

1.1 බලශක්ති සැපයුම.-

ශ්‍රී ලංකාවේ බලශක්ති සැපයුම ප්‍රධාන වශයෙන් ජෛවස්කන්ධ, ඛණිජ තෙල් හා ජල විදුලිබලය යන මූලික සම්පත් තුන මත පදනම් වී තිබේ. 2004 වර්ෂයේදී රටේ ජල විදුලිබල නිෂ්පාදනය කේටීඕඊ [1] 710.7 [2] ක් වූ අතර ජෛවස්කන්ධ පාදක බලශක්ති සැපයුම කේටීඕඊ 4, 513.3ක් විය. ආනයනික බොරතෙල්වලින් සහ ඩීසල් හා ද්‍රව පෙට්‍රෝලියම් වායුව වැනි නිමි ඛණිජ තෙල් නිෂ්පාදනවලින් ආසන්න වශයෙන් කේටීඕඊ 4,131.9ක් සපයන ලදී. එයට අමතරව, සාම්ප්‍රදායික නොවන සම්පත් (ප්‍රධාන වශයෙන් සුළං) මගින් කේටීඕඊ 3.6 ක මූලික බලශක්තියත් සපයමින් ආසන්න වශයෙන් කේටීඕඊ 9, 359.5 ක සමස්ත මූලික බලශක්තියක් සපයන ලදී. 2004 වර්ෂයේ දී ජාතික බලශක්ති සම්පාදනයට 48.2% ක් ජෛවස්කන්ධවලින් ද, 44.2% ක් බොර තෙල් සහ ඛණිජ තෙල් නිෂ්පාදනවලින් ද, ජල විදුලිබලයෙන් සහ වෙනත් පුනර්ජනනීය මූලාශ්‍රවලින් හා 7.6%ක් ද ලෙස මූලික බලශක්ති දායක විය. ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති සම්පත් භාවිතය සාපේක්ෂ වශයෙන් කුඩා ප්‍රමාණයක් බැවින් එහි වත්මන් දායකත්වය මහා පරිමාණ බලශක්ති නිෂ්පාදනය තුළ අඩු වැදගත්කමක් දරයි.

1.2 බලශක්ති ඉල්ලුමේ වර්ධනය

රටේ ආර්ථික හා සමාජීය සංවර්ධනය සමග සිදුවන වැඩිවන බලශක්ති ඉල්ලුම හේතුකොට ගෙන වාර්ෂිකව 3%ක සාමාන්‍ය වර්ධන වේගයකින් වැඩිවී මුළු මූලික බලශක්ති ඉල්ලුම වසර 2020 වන විට කේටීඕඊ 15,000 දක්වා ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. විදුලිබල හා ඛණිජ තෙල් උපඅංශ 7%- 8% ක පමණ ඉහළ වාර්ෂික වර්ධන වේගයක් වාර්තා කරනු ඇත. ශ්‍රී ලංකාවේ තිබෙන මහා පරිමාණ දේශීය මූලික බලශක්ති සම්පත් වන ජල විදුලිබලය සහ ජෛවස්කන්ධ ආශ්‍රිත බලශක්ති සැපයුම් නුදුරු අනාගතයේදී ආන්තික වශයෙන් පමණක් වැඩි වනු ඇතැයි අපේක්ෂා කෙරේ. සංවර්ධනය සඳහා ඉතිරිවී ඇති මහා පරිමාණ ජල විදුලිබල සම්පත්වල අඩු ආර්ථික ශක්‍යතාවය නිසා තවදුරටත් ජලවිදුලිබල සංවර්ධනය සීමාවීම හා ජනතාවගේ ජීවන තත්ත්වය ක්‍රමයෙන් ඉහළයාම සමග ජෛවස්කන්ධවල භාවිතය සීමාවීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත. මෙයින් අදහස් වනුයේ මධ්‍යකාලීන වශයෙන් රටේ වැඩිවන මූලික විදුලිබල අවශ්‍යතා ප්‍රධාන වශයෙන්ම සපුරාලීමට සිදු වන්නේ ආනයනික පාෂාණීභූත ඉන්ධනවලින් බවයි. දිගුකාලීන වශයෙන් දේශීය ඛණිජ තෙල් සම්පත් හා සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තීන්හි වේගවත් සංවර්ධනයන් තුළින් ශ්‍රී ලංකාවේ මූලික බලශක්ති සම්පත් සංකලනයේ කැපී පෙනෙන වෙනස්කමක් ඇති කරවනු ඇත.

1.3 *බලශක්ති අංශයේ පාලනය*

විදුලිබලය හා ඛණිජ තෙල් ශ්‍රී ලංකාවේ ප්‍රධාන වානිජ බලශක්ති සැපයුම් උපඅංශ දෙක වේ. රජය සතු උපයෝගීතා ආයතන මගින් විශාල වශයෙන් සේවය ලබන මෙම උපඅංශ දෙකම වර්තමානයේ දී ප්‍රතිසංස්කරණ ක්‍රියාදාමයකට භාජනය වෙමින් පවතී.

ජෛවස්කන්ධ ද වැදගත් වාණිජ බලශක්තියක් ලෙස ඉදිරියට එමින් පවතී.

විදුලිබල සැපයුම් කර්මාන්තය, රාජ්‍ය අංශයේ ආයතන වන ලංකා විදුලිබල මණ්ඩලය හා ලංකා විදුලි (පෞද්ගලික) සමාගම විසින් පාලනය කෙරේ. ලංකා විදුලිබල මණ්ඩලය සිරස්ව හා තිරස්ව කොටස්වලට වෙන්කර ජනනය සඳහා එක් සමාගමක්, එක් සම්ප්‍රේෂණ සහ තොග විදුලි වාණිජ සමාගමක් හා බෙදාහැරීමේ සමාගම් කිහිපයක් ඇති කිරීමට අපේක්ෂා කෙරේ. ශ්‍රී ලංකා මහජන

1. තෙල් සමතාව ටොන් දහසකි. ටීඕඊ 1 ගිගා කැලරි 10ක් ලෙස දැක්වේ.

2. තාප සමතාව පදනම මත

උපයෝගීතා කොමිෂන් සභාවක් ආකාරයෙන් වන නියාමන ව්‍යුහයක් විදුලිබල හා ඛණිජ තෙල් කර්මාන්ත ද ඇතුළු සියලු භෞතික යටිතල පහසුකම් අංශ සඳහා දැනටමත් පිහිටුවා ඇත.

භෞතික යටිතල පහසුකම් අංශ නියාමන කිරීම සඳහා 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභා පනත යටතේ ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව දැනටමත් පිහිටුවා තිබුණ ද, එයට නියාමනය සිදු කිරීමට බලය ලැබෙනුයේ අදාළ කර්මාන්ත පිළිබඳ පනත් සම්මත කර ක්‍රියාත්මක කළ විට පමණි. වර්තමානයේ ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභා පනතේ ලැයිස්තුගතකර ඇත්තේ විදුලිබල කර්මාන්තය, ජල සම්පාදන සේවා කර්මාන්තය සහ ඛණිජ තෙල් කර්මාන්තය පමණි.

දැනට, ඛණිජ තෙල් පිරිපහදු ව්‍යාපාරයේ තනි ක්‍රියාකාරිකයා වන රජය සතු ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාව (සිපෙට්කෝ) විසින් මුළු ද්‍රව පෙට්‍රෝලියම් වායු සැපයුමෙන් 15% ක් පමණ සැපයීමෙන් කරන දායකත්වය හැරුණ විට, මුළු ද්‍රව පෙට්‍රෝලියම් කර්මාන්තය සම්පූර්ණයෙන්ම පෞද්ගලික අංශය සතු වේ. සිපෙට්කෝ සමාගම මේ වන විටත් ඛණිජතෙල් බෙදා හැරීමේ කටයුතුවලදී ලංකා ඉන්දියානු තෙල් සමාගම හා තරග කරමින් සිටී. තුන්වන පාර්ශ්වයකටද ඛනිජ තෙල් බෙදාහැරීමට සම්බන්ධ විය හැකි නමුත් රටට හා එහි පාරිභෝගකයන්ට ලිහිල්කරණයෙන් සහ ඛනිජ තෙල් උපඅංශයේ ආංශික පෞද්ගලීකරණයකින් අපේක්ෂා කළ හැකි ප්‍රතිලාභ අඩුකම නිසා රජය තාවකාලිකව අත්හිටුවා තිබේ. අනාගත ඛණිජතෙල් උපඅංශ නියාමකයා වන ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව වෙත ඛණිජ උපඅංශයේ අනාගත ව්‍යුහය පිළිබඳ තීරණ ගැනීමේ බලය හිමි වනු ඇත.

විදුලිබල හා ඛණිජතෙල් උපඅංශ මෙන් නොව ජෛවස්කන්ධ උපඅංශය තවමත් විධිමත් ලෙස සංවිධානය වී නැත. විදුලිබල උත්පාදනය සඳහා මූලික බලශක්තියක් ලෙස ජෛවස්කන්ධවල දායකත්වය වැදගත් වන නව සංවර්ධනයන් සමගින් ජෛවස්කන්ධ උප අංශයද වඩා සංවිධානාත්මක වනු ඇත.

මෙම ප්‍රතිපත්ති ලේඛනයෙහි “ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති ප්‍රතිපත්තිය සහ උපායමාර්ග” කොටස් තුනකින් විස්තර කොට තිබේ.

* ශ්‍රී ලංකාවේ බලශක්ති අංශයේ සංවර්ධනය සහ අනාගත දිශාව මෙහෙවන මූලික ප්‍රතිපත්ති “බලශක්ති ප්‍රතිපත්ති මූලිකාංග” වල අඩංගු වේ.
* එක් එක් ප්‍රතිපත්ති මූලිකාංගය ඉටුකර ගැනීමට අවශ්‍යකරණ ක්‍රියාත්මක කිරීමේ රාමුව “ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ග” වලින් දැක්වේ.
* උපායමාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා වන ජාතික ඉලක්ක සහ සැලසුම්කරණ හා ආයතනික වගකීම් “ නිශ්චිත ඉලක්ක, කඩඉම් සහ ආයතනික වගකීම් ” වලින් දැක්වේ.

2 බලශක්ති ප්‍රතිපත්ති මූලිකාංග

2.1 *මූලික බලශක්ති අවශ්‍යතා සැපයීම.*

* ජනතාවගේ මූලික අවශ්‍යතා ඉටුකිරීම, ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සහ ඵලදායී ආර්ථික ක්‍රියාකාරකම් අවස්ථා සැපයීම සඳහා බලශක්ති අවශ්‍යතාවයන් ප්‍රමාණවත් ලෙස, අඛණ්ඩව සහ ආර්ථිකයට හැකි අවම පිරිවැයක් වන ලෙස සපුරාලනු ලැබේ.
* ජනතාවගේ මූලික බලශක්ති අවශ්‍යතා සැපයීම සඳහා අවශ්‍ය රාමුව සකස් කිරීම රජයේ මූලික සමාජ වගකීමක් ලෙස හදුනාගෙන ඇත. තවද රටේ ආර්ථික සංවර්ධනය හේතුවෙන් ඉහළ යන ජනතාවගේ බලශක්ති අවශ්‍යතා සපුරාලීමට ආර්ථිකයට අඩුම වියදමක් වන ලෙස ප්‍රමාණවත්ව හා අඛණ්ඩව බලශක්ති සැපයුම් පවත්වා ගැනීමේ වැදගත්කම ද රජය විසින් හදුනාගෙන තිබේ.

2.2 *බලශක්ති සැපයුම් සුරක්ෂිතතාවය තහවුරු කිරීම.*

* රටේ භාවිතා වන බලශක්ති සම්පත් විවිධාංගකරණය කෙරෙන අතර අනාගත බලශක්ති සංකලනය නිවැරදි කරනු ලැබේ.

  රටේ බලශක්ති සැපයුම් සුරක්ෂිතතාවය උපරිම කරනු පිණිස රටේ භාවිතා වන මූලික හා ද්විතියික බලශක්ති සම්පත් විවිධාංගකරණය කරනු ලැබේ. ආර්ථික පිරිවැය , පරිසරික බලපෑම් (පවතින ජලවිදුලි බලාගාරවල පෝෂක ප්‍රදේශ සම්බන්ධ බලපෑම්ද ඇතුළුව) සැපයුමේ විශ්වාසනීයත්වය, පාරිභෝගිකයන් සඳහා වන පහසුව හා උපයමාර්ගික ස්වාධීනත්වය වැනි වැදගත් බාධක සැලකිල්ලට ගනිමින් අඛණ්ඩ සැපයුමක් සහතික කිරීම සඳහා අනාගත බලශක්ති සංකලනය නිවැරදි කරනු ලැබේ.

2.3 බලශක්ති කාර්යක්ෂමතාවය හා සංරක්ෂණය ප්‍රවර්ධනය කිරීම

* කාර්යක්ෂම බලශක්ති උපයෝගීතාවක් සහ සංරක්ෂණයක් ද සහතික කරමින් බලශක්ති සැපයුම් පද්ධතිය කාර්යක්ෂම කළමනාකරණය කිරීම හා මෙහෙයවීම කරනු ලැබේ.

පාරිභෝගිකයන් හට අවම සැපයුම් පිරිවැයක් සහතික කිරීම සඳහා බලශක්ති අංශයේ උපයෝගීතා ආයතන කාර්යක්ෂමව කළමනාකරණය කිරීම සහ මෙහෙයවීම අත්‍යාවශ්‍ය වේ. උපයෝගීතා ආයතනවල සිට (සැපයුම් පාර්ශ්වයේ කළමනාකරණය) අවසන් පාරිභෝගිකයා දක්වා (ඉල්ලුම් පාර්ශ්වයේ කළමනාකරණය) වන අදාල සියලු පුද්ගලයින් විසින් කාර්යක්ෂමව බලශක්ති භාවිතා කිරීම මගින් රටේ වටිනා සම්පත් ආරක්ෂා වනවා පමණක් නොව පාරිභෝගිකයන්ට දැරීමට සිදුවන සමස්ත බලශක්ති පිරිවැයද අඩු වනු ඇත. සෑම විටම අර්ථාන්විතව බලශක්ති සංරක්ෂණය දිරිමත්ව කරගෙන යනු ලැබේ.

2.4 දේශීය සම්පත් ප්‍රවර්ධනය කිරීම

* දේශීය නොවන සම්පත් මත රඳා පැවැත්ම අවම කිරීම සඳහා ආර්ථික, පාරිසරික හා සමාජීය ගැටළු විසඳීමට යටත්ව දේශීය බලශක්ති සම්පත් ප්‍රශස්ථ මට්ටම් දක්වා සංවර්ධනය කරනු ලැබේ.

දේශීය නොවන බලශක්ති මත අඩුවෙන් රඳා පැවැත්මෙන් සහ දේශීය බලශක්ති ප්‍රශස්ථ ලෙස සංවර්ධනය කිරීමෙන් ජාත්‍යන්තර සමාජ - දේශපාලනික පරිසරය වැනි බාහිර සාධක වලින් බලශක්ති සැපයුමට සිදුවන අන්තරාදායක බලපෑම් අවම කරනු ඇත. තවද, එය රටේ ගෙවුම් ශේෂය කෙරෙහි වන පීඩනයද අඩුකරනු ඇත. රටේ ඛණිජතෙල් සහ වායු ගවේෂණ වැඩසටහන ශක්තිමත් ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ආරම්භයන් ද බලශක්ති ප්‍රතිපත්තියේ ඇතුලත් වේ.

2.5 *යෝග්‍ය මිලකරණ ප්‍රතිපත්තියක් අනුමගනය කිරීම*

* පිරිවැය පිළිබිඹුවීම, ඉලක්කගත සහනාධාරවල අවශ්‍යතාවය, සහ දේශීය වෙළඳපලේ සහ ලෝක වෙළඳපලේ දේශීය නිෂ්පාදිත භාණ්ඩ හා සේවාවන්ගේ තරගකාරිත්වය වැනි වැදගත් සාධක සැලකිල්ලට ගනිමින් බලශක්ති අංශය සඳහා යෝග්‍ය මිලකරණ ප්‍රතිපත්තියක් අනුගමනය කරනු ලැබේ.

මනා නියාමන යාන්ත්‍රණයක් නොමැති විට, විදුලිබල හා ඛණිජතෙල් යන උප අංශ දෙකෙහිම පිරිවැය පිළිබිඹු නොවන මිල ක්‍රමයක් හා ඉලක්කගත නොවූ සහනාධාර මගින් උප අංශවල උපයෝගීතා ආයතනවල වර්ධනය හා මූල්‍යමය ශක්‍යතාවය දැඩි ලෙස අවහිර කරයි. තවද, ඒවා මගින් රජයේ මූල්‍යමය සම්පත් සැළකිය යුතු ප්‍රමාණයක් යෙදවිය යුතු සෞඛ්‍ය රක්ෂණය හා අධ්‍යාපනය වැනි යටිතල පහසුකම්වලට රජයේ මූල්‍ය සම්පත් යෙදවීම වලක්වයි. එමෙන්ම, දේශීය හා ලෝක වෙළඳපලේ දේශීය භාණ්ඩවලට හා සේවාවලට ඇති තරගකාරිත්වය කෙරෙහි මිලකරණ තීරණවල බලපෑම සැලකිල්ලට ගනිමින් බලශක්ති නිෂ්පාදන හා සේවා පිළිබඳ මිලකරණ තීරණ ගැනීම වැදගත් ය. එසේම, උපයෝගීතා ආයතන විසින් විචක්ෂණශීලී ලෙස දරා ඇති පිරිවැය සඳහා පමණක් පිරිවැය පියවා ගැනීමේ ක්‍රියාදාමයේදී ඉඩ දීමද අවශ්‍යය.

2.6 *බලශක්ති අංශයේ කළමනාකරණ ධාරිතාව වැඩිකිරීම*

* බලශක්ති අංශයේ තාක්ෂණික සංවර්ධන කටයුතු හා යහපත් පාලනය කෙරෙහි නිසි අවධානය යොමු කරමින් බලශක්ති අංශය ඵලදායී ලෙස සංවර්ධනය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා දේශීය ධාරිතාව අඛණ්ඩව වැඩිකිරීමට අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගනු ලැබේ.

බලශක්ති අංශය සංවර්ධනය කිරීම හා කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය දේශීය ධාරිතාවය වර්ෂ ගණනාවක් මුළුල්ලේ ගොඩනගා තිබේ. බලශක්ති අංශයේ අඛණ්ඩ තාක්ෂණික සංවර්ධනයක් සැලකිල්ලට ගනිමින් ධාරිතාව නිරන්තරව වැඩි කළ යුතුව තිබේ. මෙම අංශයේ මතුවෙමින් පවතින් තරගකාරී වාතාවරණයේ අභියෝගවලට මුහුණ දීම සඳහා සහ යහපත් පාලනයක් සහතික කිරීම සඳහා බලශක්ති අංශයේ වෘත්තිකයන්ගේ කළමනාකරණ හැකියාවන් ඉහළ නැංවිය යුතුය.

2.7 *පාරිභෝගික ආරක්ෂණය හා සාමානාත්මතාවය සහතික කිරීම*

* බලශක්ති අංශයේ සියලු පාර්ශ්වකරුවන් සඳහා සමානාත්මතාවය සහතික කරමින් වර්තමාන හා අනාගත පාරිභෝගිකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය පියවර ගනු ලැබේ.

වර්තමාන හා අනාගත පාරිභෝගිකයන්ට සහ කොටස්කරුවන්ට විදුලිබල හා ඛනිජතෙල් උප අංශවල තමන්ට හිමි නිසි ස්ථානය දැනට ලැබී නොමැති බව රජය පිළිගනී. තවද, ආයෝජකයන්ට බලශක්ති අංශයේ ස්ථායිතාවය සනාථ කිරීමට හා සමානාත්මතාවය ප්‍රදර්ශනය කිරීමට මේ දක්වා රටට හැකි වී නොමැත. එමනිසා, පාරිභෝගිකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා

කිරීමටත්, බලශක්ති අංශයේ සියලු ආයෝජකයන් වෙනුවෙන් සාධාරණත්වය හා අනාවැකි පළ කිරීමේ හැකියාව සහතික කිරීම සඳහාත් අවශ්‍ය පියවර ගනු ලැබේ.

2.8 *බලශක්ති සේවාවන්ගේ ගුණාත්මකභාවය වැඩි කිරීම*

* සුදුසු තත්ත්ව ප්‍රමිතීන් පැනවීම මගින් හා නියාමන මැදිහත් වීම් මගින් බලශක්ති සේවාවන්ගේ ගුණාත්මකභාවය සහතික කරනු ලැබේ.

බලශක්ති සේවාවන්ගේ අඩු ගුණාත්මකභාවය රටේ ආර්ථික සංවර්ධනය සහ ජනතාවගේ සාමාන්‍ය ජීවන තත්ත්වය කෙරෙහි අයහපත් ලෙස බලපායි. පාරිභෝගික අයිතිවාසිකම් කෙරෙහි අවධානය යොමු කරමින් මේ සම්බන්ධයෙන් වැඩිදියුණු කිරීම් කිරීම සඳහා නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගනු ලැබේ.

2.9 *බලශක්ති පහසුකම්වල (විදුලිබලාගාර ආදිය) අහිතකර පාරිසරික බලපෑම්වලින් ආරක්ෂා කිරීම.*

* බලශක්ති සැපයුම් සංවර්ධන හා මෙහෙයුම් කටයුතු හේතුවෙන් සිදුවන අයහපත් පාරිසරික හා සමාජයීය බලපෑම් අවම කිරීම සඳහා සුදුසු පියවර ගනු ලැබේ.

විදුලිබල හා බලශක්ති උප අංශවල කටයුතු හේතුවෙන් සමාජයට හා පරිසරයට සිදුවන අයහපත් බලපෑම් කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් යොමුවිය යුතුය. මේ සම්බන්ධයෙන් ජනතාව හා සේවකයින් ආරක්ෂා කිරීම සිය මූලික යුතුකමක් ලෙස රජය හඳුනාගෙන තිබේ.

බලශක්ති අංශයේ සියලු සංවර්ධන කටයුතු හා මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ අදාළ පාරිසරික රෙගුලාසි හා ප්‍රමිතීන් අනුගමනය කළ යුතුය.

3. *ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ග*

බලශක්ති අංශයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා වන පුළුල් උපායමාර්ග පහත සඳහන් පරිදි වේ:—

3.1 *මූලික බලශක්ති අවශ්‍යතා සැපයීම*

* පවතින සම්පත් ආරක්ෂා කිරීමෙන් හා වැඩි දියුණු කිරීමෙන් ගෘහ භාවිතය සඳහා අවශ්‍ය ජෛවස්කන්ධවල පැවැත්ම (සැපයුම) සහතික කරනු ලැබේ.

* විදුලිබලය හා ඛණිජ තෙල් ආශ්‍රිත ඉන්ධන වැනි වාණිජ බලශක්ති ග්‍රාමීය ප්‍රදේශවලට වැඩියෙන් ප්‍රවේශ කරවීම සඳහා ප්‍රමුඛතාවය ලබාදෙනු ලැබේ.

* විදුලිබල පද්ධතියෙන් හෝ පද්ධතියෙන් බැහැරව, සමස්ත ජනතාවට මූලික විදුලිබල අවශ්‍යතා සපුරාලීමේ වත්මන් වැඩපිළිවෙල පුළුල් කරනු ලබන අතර, එම අවශ්‍යතා සපුරාලීම සඳහා විධිමත් ක්‍රියාකාරී සැලැස්මක් සකස්කර ක්‍රියාත්මක කරනු ලැබේ.

* බලශක්ති උත්පාදනය සඳහා වන වැව්ලි දිරිගන්වනු ලැබේ.

* දැරිය හැකි මිලක් යටතේ සුදුසු ජන කොටස්වලට ඔවුන්ගේ මූලික බලශක්ති අවශ්‍යතා සැපයෙන බවට සහතික වනු පිණිස එම ජන කොටස්වලට සහනාධාර ලබාදීම සඳහා පාරදෘශ්‍ය යාන්ත්‍රණයක් ස්ථාපිත කරනු ලැබේ. නාගරික හා ග්‍රාමීය ප්‍රදේශවල සහනශීලී ජීවන විදුලිබල ගාස්තු යටතේ සිටින පාරිභෝගිකයන්ට අඩු වියදම් සම්මතගත විදුලි සබඳතා ලබා දීමද මෙයට ඇතුළත් ය. නාගරික හා ග්‍රාමීය ප්‍රදේශවල අඩු ආදායම්ලාභී ජන කොටස්වලට භූමිතෙල් සහනාධාරය ලබාදෙන අතර, ග්‍රාමීය ප්‍රදේශවල ඛණිජ තෙල් ආශ්‍රිත ඉන්ධනවල පැවතීම (සැපයුම) වැඩි කිරීමද මෙයට ඇතුළත් ය.

3.2 **බලශක්ති සැපයුම් සුරක්ෂිතතාවය තහවුරු කිරීම**

* ජෛවස්කන්ධවල තත්ත්වය නවීන පහසු බලශක්ති සම්පතක් බවට උසස් කිරීමෙන් ඒවායේ භාවිතය වැඩි කරනු ලැබේ.

* ඛනිජතෙල් හෝ ඛනිජතෙල් මිල හා බැඳී පවතින ඉන්ධන භාවිතා නොකරන විදුලිබල උත්පාදන තාක්ෂණයෙන් භාවිතා කෙරෙන ලෙස විවිධාංගකරණය කිරීම මගින් බිදුලිබල උත්පාදනයේ ඉන්ධන විවිධාංකරණය සහතික කරනු ලැබේ.

* කාර්ය බහුල නොවන අවස්ථාවන්හිදී විදුලිය සැපයීමේ ක්‍රමයක් සහ ජෛව-ඉන්ධන භාවිතය දියුණු කිරීම මත පදනම් වූ දුම්රිය හා මහාමාර්ග ප්‍රවාහන ක්‍රමයක් මගින් ප්‍රවාහන අංශයේ ඉන්ධන විවිධාංගකරණය දිරිගන්වනු ලැබේ.

* අසල්වැසි රටවල් සමග දේශසීමා හරහා ඵලදායි ලෙස බලශක්ති හුවමාරු කිරීම් විවිධ ආකාරයෙන් සිදු කෙරෙන කලාපීය සහයෝගිතාවය ප්‍රවර්ධනය කරනු ලැබේ.

* රටේ ඛණිජ තෙල් ඉල්ලුම ප්‍රශස්ත ආකාරයෙන් සපුරාලීම සඳහා දේශීය බොර තෙල් පිරිපහදු ධාරිතාවය වැඩිකරනු ලැබේ.

* ඛණිජතෙල් සිල්ලර ව්‍යාපාරයේ සෑම කොටස් කරුවෙකු විසින්ම උපාය මාර්ගික ඉන්ධන සංචිතයක් පවත්වා ගැනීම සහතික කරනු ලැබේ.

3.3 බලශක්ති කාර්යක්ෂමතාවය හා සංරක්ෂණය ප්‍රවර්ධනය කිරීම

* විදුලි උපකරණ බලශක්ති ලේබල්කරණය, ගොඩනැගිලි පිළිබඳ නීති සංග්‍රහ හා බලශක්ති විගණන වැනි බලශක්ති අවසාන භාවිතය හා අනිවාර්ය ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් මුල්‍යමය හා වෙනත් දිරි ගැන්වීම්/අධෛර්යමත් කිරීම් තුළින් සැපයුම් පාර්ශ්වයේ හා බලශක්ති අවසාන භාවිතයේ කාර්යක්ෂමතාවය දිරි ගන්වනු ලැබේ.

* බලශක්ති කාර්යක්ෂමතාවය පිළිබඳ විශේෂඥ දැනුම සැපයීමේදී පෞද්ගලික අංශයේ දායකත්වය ප්‍රවර්ධනය කෙරෙන අතර ඒ සඳහා පහසුකම් සපයනු ලැබේ.

* බලශක්ති පරිවර්තනය, සම්ප්‍රේෂණය, බෙදා හැරීම හා භාවිතය පිළිබඳ කාර්යක්ෂමතාවය අඛණ්ඩව වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය වන මුල්‍ය සම්පත් බලශක්ති අංශය තුළින් මෙන්ම ඉන් බාහිරවද සුදුසු බලශක්ති ගාස්තු පැනවීම මගින් හා මුල්‍ය සම්පාදකයන් හා එක්ව දිගුකාලීන මුල්‍ය සම්පාදන වැඩසටහන් සැළසුම් කිරීම මගින් සපයා ගනු ලැබේ.

* බලශක්ති සංරක්ෂණය හා කළමනාකරණයට අදාළ සියලු කටයුතු සම්බන්ධීකරණය බලශක්ති සංරක්ෂණ අරමුදල වෙත පවරනු ලබන අතර මෙම නව වගකීම් ඇතුළත් කිරීම සඳහා බලශක්ති සංරක්ෂණ පනත සංශෝධනය කරනු ලැබේ.

* ප්‍රමුඛතා සහ තිරසර පදනමක් මත බලශක්ති කාර්යක්ෂමතාවය හා සංරක්ෂණය පිළිබඳව මහජන අධ්‍යාපන හා දැනුවත් කිරීමේ වැඩටසහනක් ආක්‍රමණශීලි ලෙස කරගෙන යනු ලැබේ.

* නිවාසවල හා අවිධිමත් වාණිජ/කර්මාන්ත අංශවල කාර්යක්ෂම උදුන් වැනි තාක්ෂණයන් පුළුල් ලෙස පතළ කරනු ලැබේ.

* පවතින ඛණිජ තෙල් බෙදාහැරීමේ යටිතල පහසුකම් ප්‍රශස්ථ මට්ටමට පත්කරනු ලැබේ.

* විදුලිබල උත්පාදන හා ජාලමය හානි හැකි ඉතාම අඩු මට්ටමක් දක්වා පහත හෙළනු ලබන අතර අවශ්‍ය උත්පාදන, සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් ආයෝජන හා සැපයුම් පද්ධතියේ කාර්යක්ෂම කළමනාකරණය තුළින් ධාරිතාවය වැඩි දියුණු කරනු ලැබේ.

* වඩා බලශක්ති කාර්යක්ෂමතාවයකින් හෙබි ප්‍රවාහන පද්ධතියක් බවට පත් කරනු පිණිස දුම්රිය ප්‍රවාහන ජාලයේ ඵලදායී අංශ විදුලිකරණය සහ මගී ප්‍රවාහනයේ හා භාණ්ඩ ප්‍රවාහනයේ අන්තර් මාධ්‍ය විස්ථාපනය ධෛර්යමත් කිරීමට ප්‍රයත්න දරනු ලැබේ.

* මගී කිලෝමීටරයකට හෝ භාණ්ඩ ටොන් කිලෝමීටරයකට අඩු බලශක්ති ප්‍රමාණයක් දැවෙන විශාල ධාරිතා වාහන සහිත ප්‍රවාහන ක්‍රම භාවිතය සඳහා මාධ්‍ය විස්ථාපනයට අනුබල දෙනු ලැබේ. මාර්ග ප්‍රවාහනයට වඩා දුම්රිය ප්‍රවාහනයට ප්‍රමුඛත්වය හිමි වේ.

* ප්‍රවාහන අංශයේ ඉහළ කාර්යක්ෂමතාවයක් ලබා ගැනීම සඳහා වන ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ගයක් ලෙස මාර්ග ප්‍රවාහනයේ හා දුම්රිය ප්‍රවාහනයේ මනා සම්බන්ධීකරණයක් ඇති කරනු ලැබේ.

* වාහනවලින් ගමන් කරන්නන්ගේ හා පදිකයින්ගේ ආරක්ෂාව වැඩි කරන සහ මනා සෞන්දර්යාත්මක හැඟීම් දනවන පරිසරයක් සහිත බලශක්ති සංරක්ෂණයකට දායක වන වීදි ආලෝකකරණයේ මනා කළමනාකරණයක් සහතික කරනු පිණිස රටේ වීදි අලෝකකරණ උපායමාර්ගික සැලැස්මක් පිළියෙල කරනු ලැබේ.

3.4 දේශීය සම්පත් ප්‍රවර්ධනය කිරීම

* සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති සම්පත් සංවර්ධනය කරන්නන්ට පාරදෘශ්‍ය මිලදී ගැනීමේ ක්‍රියාවලියන් තුළින් තරග කිරීමට හා හොඳම මිලකට බලශක්තිය සැපයීමට හැකිවන ලෙස සමානාත්මකව සැළකීම මගින් ආර්ථික වශයෙන් ශක්‍ය (ඵලදායී) පරිසරහිතකාමී එවැනි බලශක්ති සම්පත් භාවිතය ඉහළ නංවනු ලැබේ.

* ආර්ථිකමය, පාරිසරික හා සමාජයීය වශයෙන් ශක්‍ය (ඵලදායී), එහෙත් සාමාන්‍ය වාණිජ කොන්දේසි යටතේ ඵලදායී නොවන ඉතිරිව ඇති මධ්‍යම පරිමාණ ජල විදුලිබල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා සහනශීලි අරමුදල් ඉල්ලා සිටිනු ලැබේ. කෙසේ වුවද, මෙවැනි ව්‍යාපෘතිවලින් උත්පාදනය කරන විදුලිබලය මිලකරණය කරනු ලබන්නේ වාණිජමය කොන්දේසි යටතේ ය.

* අවශ්‍ය දිරිගැන්වීම් සපයනු ලබන අතර ආර්ථිකමය ශඛ්‍යතාවය (ඵලදායිතාව) අඩු වුව ද විශේෂ අවස්ථාවන්හිදී සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති සම්පත්වල දායකත්වය සහතික කරනු පිණිස පවිත්‍ර සංවර්ධන යාන්ත්‍රණය ඇතුළුව හරිත අරමුදල් ප්‍රවේශය සඳහා පහසුකම් සලසනු ලැබේ.

* සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති සම්පත්වල විධිමත් සැළසුම්කරණයක් හා ප්‍රවර්ධනයක් සඳහා කැපවූ පහසුකම් සපයන ආතනයක් ස්ථාපිත කරනු ලැබේ.

* ඛනිජතෙල් හා ස්වාභාවික වායු සම්පත් ගවේෂණය කරනු ලබන අතර ඒවා වාණිජමය වශයෙන් ප්‍රයෝජනයට ගනු ලැබේ. රාජ්‍ය හා පෞද්ගලික යන දෙඅංශයේම ආයෝජන මේ සඳහා යොදවනු ලැබේ.

* ඉඩම් සම්පත් පවතින ප්‍රදේශවල ග්‍රාමීය ආදායම් උත්පාදන මාර්ග ඇති කිරීම කෙරෙහි අවධාරණය කරමින් නව කාර්මික ක්‍රියාකාරකම්වලට ඉඩ සලසමින් එවැනි ප්‍රදේශවල ජෛවස්කන්ධ ආශ්‍රිත බලශක්ති ව්‍යාපෘති සංවර්ධන කරනු ලැබේ.

* සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති භාවිතය පිළිබඳව විශේෂ සැලකිල්ලක් දක්වමින් දේශීය තත්ත්වයන්ට ගැලපෙන නව හා නැගී එන තාක්ෂණයන් අනුගමනය කෙරෙන පර්යේෂණ හා සංවර්ධන කටයුතු ප්‍රවර්ධනය කරනු ලැබේ.

* ප්‍රවාහන අංශය සඳහා විකල්ප බලශක්ති සම්පතක් ලෙස ජෛව-ඉන්ධන සංවර්ධනය කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

* ජෛවස්කන්ධ හා අනෙකුත් අපද්‍රව්‍ය බලශක්තිය බවට පත් කරන වෙනත් අංශවල හා ආයතනවල ක්‍රියාමාර්ග සඳහා අවශ්‍ය අවස්ථාවන්හිදී දිරිදීම හා සහාය දීම කරනු ලැබේ.

3.5 යෝග්‍ය මිලකරණ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම

* මිලකරණ ප්‍රතිපත්තිය සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා විදුලිබල හා ඛණිජතෙල් උප අංශද ඇතුළු බලශක්ති අංශය නියාමනය කිරීම සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙත බලය පවරනු ලැබේ.

* සියලු වාණිජ බලශක්ති නිෂ්පාදන (විදුලිබලය, ඛණිජතෙල් නිෂ්පාදන, ද්‍රව පෙට්‍රෝලියම් වායු) සඳහා පිරිවැය පිළිඹිබු කරන මිලකරණ ප්‍රතිපත්තියක් සපුරාලන පරිදි සකස් කෙරෙන හා නිතර යාවත්කාලීන කෙරෙන යෝග්‍ය මිලකරණ උපායමාර්ග ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් සකස් කර ක්‍රියාත්මක කරනු ලැබේ. මූලධනය මත වන සාධාරණ ප්‍රතිලාභ, ප්‍රාග්ධන ආයෝජනය හා ණය සේවා සඳහා වන අභ්‍යන්තර මුදල් උත්පාදනය වැනි අංග මෙම මිල ගණන්වල ඇතුළත් වේ.

* ප්‍රශස්ථ බලශක්ති සැපයුම් පුළුල් කිරීමේ සැලසුම් නියමිත වේලාවට ක්‍රියාත්මක කෙරෙන බවට සහතික වනු පිණිස අවශ්‍ය වන ක්‍රියාමාර්ග ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් ගනු ලබන අතර ඒ අනුව පිරිවැය පිළිබිඹුවන මිල ගණන් මෙම ප්‍රශස්ථ සැලසුම් මත පදනම් කරනු ලැබේ.

* සමාජ අවශ්‍යතා හෝ වාණිජමය යථාර්ථයන් අනුව විශේෂ අවධානය යොමු විය යුතු ඉලක්ක ගත පාරිභෝගික කණ්ඩායම් හඳුනා ගැනීමේ යාන්ත්‍රණයක් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව මගින් ස්ථාපිත කරනු ලැබේ.

3.6 බලශක්ති අංශයේ කළමනාකරණ ධාරිතාවය වැඩි කිරීම

* තිරසර අඛණ්ඩ කාර්යයක් ලෙස බලශක්ති අංශයේ ඒකාබද්ධ දිගුකාලීන බලශක්ති සැලසුම් සංවර්ධනය කිරීම හා ප්‍රතිපත්ති විශ්ලේෂණය කිරීම සඳහා බලශක්ති විෂය භාර අමාත්‍යාංශයේ ධාරිතාවය සංවර්ධනය කිරීම හා ශක්තිමත් කිරීම කරනු ලැබේ.

* විදුලිබල පද්ධතියෙන් බාහිර විදුලිබල සැපයුම් සංවර්ධනයේ දායකත්වය වැඩි කිරීම හා පුළුල් කිරීම සඳහා පළාත් සභා තුළ වන ධාරිතාවය සංවර්ධනය කරනු ලැබේ.

* ජාතික බලශක්ති දත්ත පදනම පුළුල් කර, වැඩිදියුණු කර කළමනාකරණය කරනු ලැබේ.

* සුදුසු පුහුණු කිරීම්, සවිබල ගැන්වීම් හා නිසිපරිදි බලය පැවරීම් මගින් බලශක්ති අංශයේ ආයතනවල කළමනාකරණ හැකියාව වැඩි කරනු ලැබේ.

3.7 පාරිභෝගික ආරක්ෂණය හා සමානාත්මතාවය සහතික කිරීම

* විවිධ බලශක්ති නිෂ්පාදන හා සේවාවන් සම්බන්ධයෙන් පාරිභෝගිකයන්ට සාධාරණය ඉටු වන බවට සහතික වනු පිණිස ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව ශක්තිමත් කෙරෙන අතර එයට අවශ්‍ය සහාය ලබා දෙනු ලැබේ.

* බලශක්ති අංශයේ සිටින සියළු කොටස්කරුවන් සඳහා සමානාත්මතාවය සහතික කිරීම පිණිස ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව සඳහා උපකාරිවන පරිසරයක් නිර්මාණය කරනු ලැබේ.

3.8 බලශක්ති සේවාවන්ගේ ගුණාත්කමභාවය වැඩි කිරීම

* නිෂ්පාදන හා සේවාවල යම් අවම ගුණාත්මකභාවයක් පවත්වාගෙන යාමට ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් බලශක්ති අංශයේ උපයෝගීතා ආයතනවලට බල කරනු ලැබේ.

* අදාළ උපයෝගීතා ආයතන සඳහා අවසර දී ඇති ප්‍රතිලාභවල සාධාරණ වැඩි කිරීම්වලට අවසරදීම මගින් උසස් ගුණාත්මකභාවය දිරිගන්වනු ලැබේ.

3.9 බලශක්ති පහසුකම්වල (විදුලිබලාගාර ආදිය) අහිතකර පාරිසරික බලපෑම්වලින් ආරක්ෂා කිරීම

* ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව විසින් නිකුත් කළ ආරක්ෂක ප්‍රමිතීන් හා රජය විසින් නියම කර ඇති පාරිසරික ප්‍රමිතීන් සමග අනුකූල වන ලෙසට බලශක්ති අංශයේ උපයෝගීතා ආයතනවලට බල කරනු ලැබේ.

* බලශක්ති අංශයේ උපයෝගීතා ආයතනයන් හෙතුකොටගෙන සිදුවන හදිසි අනතුරුවලට හා ආපදාවලට භාජනය වන්නන්හට වන්දි ලබාදීමේ ක්‍රමයක්, සියළු කොටස්කරුවන්ගේ දායකත්වය ඇතිව ස්ථාපිත කරනු ලැබේ.

* ජාතික පරිසර පනතේ ප්‍රමිතීන්ට හා රෙගුලාසිවලට අනුකූල වන අයුරින් පවතින හා නව පහසුකම් (විදුලිබලාගාර ආදිය) සඳහා පාරිසරික ආරක්ෂක විගණන පැවැත්වීමට හැකි සුදුසුකම් තිබෙන කාර්ය මණ්ඩලයක් සහිත පාරිසරික අංශයක් බලශක්ති අංශයේ සෑම උපයෝගීතා ආයතනයක් විසින්ම ස්ථාපිත කරනු ඇත.

3.10 පොදු උපායමාර්ග

* බලශක්ති අංශයේ සංවර්ධනය සඳහා රාජ්‍ය හා පෞද්ගලික යන දෙඅංශයේම ආයෝජනයට ඉඩ සැලසෙන පරිදි එම අංශය ප්‍රතිසංස්කරණය හා ප්‍රතිව්‍යුහගත කරනු ලැබේ. එහි ප්‍රතිපත්ති සම්පාදනය හා නියාමනය රාජ්‍ය අංශය සතුව පවතින අතර, මෙහෙයවීම හා කළමනාකරණය රාජ්‍ය හා පෞද්ගලික යන දෙඅංශයටම විවෘත කරනු ලැබේ.

* විදුලිබල ප්‍රතිසංස්කරණ (සංශෝධන) පනත හා ලංකා විදුලිබල මණ්ඩල (සංශෝධිත) පනත අනුව ලංකා විදුලිබල මණ්ඩලය කොටස්වලට වෙන් කිරීම මගින් විදුලිබල උප අංශය ප්‍රතිසංස්කරණය කරනු ලැබේ. ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවට නිදහස් හා ස්වාධීන නියාමන ආයතනයක් ලෙස ස්ථාපිත වීම සඳහා අවශ්‍ය සියළු සහාය ලබාදෙනු ලැබේ.

* රාජ්‍ය හා පෞද්ගලික අංශවල ආයෝජන ආකර්ශනය කර ගැනීම මගින් විදුලිබල හා ඛණිජතෙල් උප අංග තුළ සුදුසු වෙළඳපල ව්‍යුහයක් ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය පියවර ගනු ලැබේ.

* ඛණිජතෙල් උප අංශය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා අවශ්‍ය නීති සම්පාදනය කරනු ලබන අතර එම උප අංශයේ නියාමනය සිදු කිරීම සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව වෙත බලය පවරනු ලැබේ.

* ලෝක පරිසරයට ප්‍රතිලාභ සැලසෙන බලශක්ති කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමට හා රටේ පුනර්ජනනීය බලශක්ති සංවර්ධන ව්‍යාපෘති සඳහා මුල්‍ය සම්පාදනයට ආධාර වන පවිත්‍ර සංවර්ධන යාන්ත්‍රණය වැනි ජාත්‍යන්තර වැඩපිළිවෙලවල් වලින් උපරිම ප්‍රතිලාභ ලබා ගැනීමට පියවර ගනු ලැබේ.

* බලශක්ති අංශයේ සැපයුම් පාර්ශ්වයේ ආයෝජනයන් සඳහා ව්‍යාපෘති තේරීමේ මූලධර්ම සකස් කිරීමට ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙත බලය පවරනු ලැබේ.

* බලශක්ති කාර්යක්ෂමතාවය හා සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය සම්බන්ධයෙන් නියම කරන ලද ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ගැනීම සහතික කිරීම සඳහා මධ්‍යම ආයතනයක් වෙත ඒ පිළිබඳව බලය පවරනු ලැබේ.

* බලශක්ති අංශයේ ගැටළු විසඳීම පිළිබඳ පර්යේෂණ හා සංවර්ධන කටයුතු දිරිගැන්වීම හා ප්‍රවර්ධනය කරනු ලැබේ. බලශක්ති අධ්‍යයනය සඳහා විශේෂිත ජාතික කේන්ද්‍රයක් පිහිටුවීමේ අදහසින් බලශක්ති පිළිබඳ පර්යේෂණ හා සංවර්ධන කටයුතු කිරීම සඳහා පවතින පර්යේෂණ ආයතනවලට ආධාර කරනු ලැබේ.

4. **නිශ්චිත ඉලක්ක, කඩඉම් හා ආයතනික වගකීම්**

හඳුනාගත් බලශක්ති අංශ උපායමාර්ග ක්‍රියාත්මක කිරීමේ දී සපුරා ගත යුතු නිශ්චිත ඉලක්ක හා කඩඉම් මෙම කොටසින් විස්තර කරයි. තවද, එක් එක් කාර්යයට අදාළව මෙම උපායමාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා වගකිව යුතු ආයතනද මෙම කොටසින් හඳුනා ගැනේ.

4.1 **නිවාසවලට විදුලිබලය සැපයීම.-**

ජාතික විදුලිබල පද්ධතිය දීර්ඝ කර හැකි සියලුම ප්‍රදේශවලට විදුලිබලය ලබාදීමට කටයුතු කරන අතර, විදුලිබල පද්ධතියෙන් බැහැර තාක්ෂණයන් භාවිතා කරමින් ඉලක්කගත ග්‍රාමීය බලශක්ති අවශ්‍යතාවයන් වෙත විදුලිබලය සපයනු ලැබේ. විදුලිබල පද්ධතියෙන් විදුලිබලය ලැබෙන නිවාසවලට ලැබෙන මූලධන සහනාධාර විදුලිබල පද්ධතියෙන් බැහැරව විදුලිබලය අපේක්ෂිත නිවාස වලටද පළාත් අධිකාරීන් හරහා ලබාදෙනු ලැබේ.

* විදුලිබල පද්ධතිය දීර්ඝ කිරීමෙන් නිවාසවලට විදුලිබලය සැපයීමේ මධ්‍යමකාලීන ඉලක්ක

වර්ෂය	*විදුලිබල පද්ධතිය වෙත ප්‍රවේශය ලබා දිය යුතු මුළු නිවාස සංඛ්‍යාව*
2003	65% (තථ්‍ය)
2006	75%
2010	80%
2015	85%

* විදුලිබල පද්ධතියෙන් බැහැරව නිවාසවලට විදුලිබලය සැපයීමේ මධ්‍යමකාලීන ඉලක්ක

වර්ෂය	*විදුලිබල පද්ධතියෙන් බැහැර විදුලිබල ක්‍රම භාවිතා කරන මුළු නිවාස සංඛ්‍යාව*
2003	2% (තථ්‍ය)
2006	4%
2010	6%
2015	8%

ආයතනික වගකීම.- විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය විසින් සෑම වර්ෂයකම යාවත්කාලීන කෙරෙන දීර්ඝ කාලීන විදුලිබලය සැපයීමේ සැලැස්මක් පිළියෙල කරනු ඇත. විදුලිබල උපයෝගීතා ආයතන, බලශක්ති සංරක්ෂණ අරමුදල, පළාත් සභා හා අනෙක් කොටස්කරුවන්ගේ සහාය ඇතිව එය ක්‍රියාත්මක කිරීමේ වගකීම ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව වෙත පැවරේ.

4.2 **ඉලක්කගත සහනාධාර.-**

* විදුලිබලය හා භූමිතෙල් සඳහා වන සාමාන්‍ය සහනාධාරය 2007 වර්ෂයේදී ඉවත් කරනු ලැබේ. පහත දැක්වෙන පදනමින් සහනදායී මිලට විදුලිබලය හා භූමිතෙල් 2007 වර්ෂයේදී ගෘහස්ථ භාවිතය සඳහා ලබා දෙනු ලැබේ.

නිවාස වර්ගය	*සහනාධාරයේ ඉලක්කය*	*සහනාධාරයේ මට්ටම*	*සහනාධාර ක්‍රමය*
විදුලිබල පද්ධතියෙන් විදුලිබලය සැපයෙන නිවාස	සියළුම සමෘද්ධි ප්‍රතිලාභීන්ට	පළමු කිලෝ වොට් පැය 30 ක විදුලි බලය සැපයීමේ වියදමෙන් 50% ක්, කූපන්පත් මගින්	සමාජයීය හේතු අනුව දැනට ක්‍රියාත්මක විදුලිබල අය ක්‍රමයේ අතුරු සහනාධාර අහෝසි කිරීමෙන් එකතුවන ඉතිරි කිරීම්වලින් මහා භාණ්ඩාගාරය මගින් මෙම මුළු සහනාධාරයම ලබා දිය යුතුව ඇත.
විදුලිබල පද්ධතියෙන් බැහැර තාක්ෂණයෙන් විදුලිබලය සැපයෙන නිවාස		විදුලිබල පද්ධතියෙන් බැහැර සැපයුම්වලට ගෙවීම් කිරීමට විදුලිබල සහනාධාරයේ (ඉහත ආකාරයට) වටිනාකමට කූපන්පත් ලබා දෙනු ලැබේ.	
විදුලිබලය නොමැති නිවාස		භූමිතෙල් මිලට ගැනීමට විදුලිබලය සහනාධාරයේ (ඉහත ආකාරයට) වටිනාකමට කූපන්පත් ලබා දෙනු ලැබේ.	

ආයතනික වගකීම.- විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙත තවදුරටත් අවශ්‍ය ප්‍රතිපත්ති මග පෙන්වීම් සිදු කරනු ලැබේ. ඉලක්කගත සහනාධාර ලබාදීම සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව සැලසුම් සකස් කර ඒවා ක්‍රියාත්මක කළ යුතුය.

4.3 **ඉන්ධන විවිධත්වය හා සුරක්ෂිතතාවය.-**

* විදුලිබල උප අංශය වර්තමානයේ පවතින ද්විත්ව බලශක්ති සම්පත් (ජල විදුලිබලය හා ඛණිජ තෙල්) තත්ත්වයේ සිට බහුවිධ සම්පත් තත්ත්වයක් වෙත කඩිනමින් ගමන් කළ යුතුය.

* වෙනත් වර්ගවල විදුලිබලාගාරවල තාක්ෂණික සීමාවන් නිසා දීර්ඝකාලීන විදුලිබල උත්පාදනය පුළුල් කිරීමේ සැලසුමේ අන්තර්ගත කිරීමට අවශ්‍ය වනනේ නම් මිස, ඛණිජ තෙල්, ඛණිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදන හෝ ඛණිජතෙල් මිල සමඟ දර්ශකගතව පවතින වෙනත් ඉන්ධන භාවිතා වන කිසිදු විදුලිබලාගාරයක් ඉදිකිරීමට රජය පියවර නොගන්නා අතර ඒ සඳහා විදුලිබල උපයෝගිතා ආයතන විසින් හෝ පෞද්ගලික අංශය විසින් ඉදිරිපත් කරන යෝජනා පිළිගනු නොලැබේ. ඛනිජතෙල් ආශ්‍රිත විදුලිබලාගාර සඳහා වන මෙම තාවකාලික තහනම දීර්ඝකාලීන විදුලිබල උත්පාදනය පුළුල් කිරීමේ සැලසුමට අදාළ කර ගැනෙන අතර, ශ්‍රී ලංකාවේ ජාතික විදුලිබල බලශක්තියෙන් 80%ක් ඛණිජ තෙල් ආශ්‍රිත නොවන සම්පත්වලින් සැපයෙන තෙක් ක්‍රියාත්මකව පවතිනු ඇත. රජයේ උපායමාර්ගය වන්නේ තුන්වන බලශක්ති සම්පතක් වෙත වහාම විවිධාංගකරණය වීමයි. මිල හා සැපයුම් වෙනස්වීම් සම්බන්ධයෙන් හැකි උපරිම ආරක්ෂාව තහවුරු කිරීමට සහ ඉහළ යන ඉල්ලුම විශ්වාසනීය ලෙස සැපිරෙන බවට වගබලා ගැනීමට මෙම තෙවන බලශක්ති සම්පත විය යුත්තේ ගල් අඟුරුය. දීර්ඝකාලීන විදුලිබල උත්පාදනය පුළුල් කිරීමේ සැලසුම් අධ්‍යයන මගින් මෙම උපාය මාර්ගයේ ශක්‍යතාවය තහවුරු කර ඇත. මෙම විවිධාංගකරණ හා ආරක්ෂණ උපායමාර්ගයේ සිව් වැනි බලශක්ති සම්පත වන්නේ සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තියයි. ගලඅඟුරු හා සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති සම්පත්වලින් අපේක්ෂිත විදුලබල උත්පාදන ඉලක්ක පහත සඳහන් වේ.

වර්ෂය	මුළු සැපයුමේ කොටසක් ලෙස විදුලිබල පද්ධතියට සැපයෙන විදුලිබල බලශක්තිය				
	සාම්ප්‍රදායික ජල විදුලි බලය	ඛණිජ තෙල්වලින් උපරිම	ගල් අඟුරු	සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිවලින් අවම	විස්තර සටහන්
1995	94%	6%	0%	0%	තථ්‍ය
2000	45%	54%	0%	1%	තථ්‍ය
2005	36%	61%	0%	3%	තථ්‍ය, ඛණිජ තෙල් හෝ ඊට සමාන මිලක් සහිත ඛනිජ තෙල්/වායු නිෂ්පාදන දහනය කරන විදුලි බලාගාර පිළිබඳව වන තාවකාලික තහනම 2006 වර්ෂයේදී ක්‍රියාත්මක වේ.
2010	42%	31%	20%	7%	ගල් අඟුරු හා සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිවලට වැඩිවන විවිධාංගීකරණය ඉහත තාවකාලික තහනම ක්‍රියාත්මකයි.
2015	28%	8%	54%	10%	ඛණිජ තෙල් හෝ ඊට සමාන මිලක් සහිත ඛණිජ තෙල්/වායු නිෂ්පාදන දහනය කරන විදුලි බලාගාර පිළිබඳව වන තාවකාලික තහනම ඉවත් කළ හැකිය.

* ඛණිජතෙල් උප අංශයේ බෙදාහැරීමේ සෑම සිල්ලර ව්‍යාපාරිකයෙකු විසින්ම දින 30 ක පාරිභෝජනයකට සමාන උපායමාර්ගික සංචිතයක් සෑම අවස්ථාවකම පවත්වා ගෙන යා යුතුය. කාර්මික තාප භාවිතයේ දී හා ප්‍රවාහන භාවිතයේ දී ඛණිජතෙල් ආශ්‍රිත ඉන්ධන භාවිතය වෙනුවට පවිත්‍ර සංවර්ධන යාන්ත්‍රණය වැනි හරිත අරමුදල් සම්පාදන ප්‍රවේශයට අනුග්‍රහය සැපයීම

ඇතුළු ඉන්ධන භාවිතය වෙනස්කිරීමේ ධෛර්මත් කිරීම් මගින් සුදුසු දිරිගැන්වීම් ලබාදී දේශීය ජෛවස්කන්ධ හා ජෛව-ඉන්ධන භාවිතය ඇති කිරීමට සෑම උත්සාහයක්ම ගනු ලැබේ.

ආයතනික වගකීම්.- මෙම ඉන්ධන විවිධාංගකරණ හා ආරක්ෂණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා සහ ඉලක්ක සපුරා ගැනීම සඳහා වන ආයතනික වගකීම ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව, විදුලිබල උපයෝගිතා ආයතන හා ඛණිජතෙල් උප අංශයේ කොටස්කරුවන් වෙත පවතී. දීර්ඝකාලීන විදුලිබල උත්පාදනය පුළුල් කිරීමේ සැලසුම මගින් ඉහත උපායමාර්ග හා කඩඉම් පිළිබිඹු කරනු ඇත. දීර්ඝ කාලීන විදුලිබල උත්පාදනය පුළුල් කිරීමේ සැලසුම වසර 20 ක දීර්ඝකාලීන එකක් වන අතර එය අඩු වශයෙන් වර්ෂ දෙකකට වරක්වත් යාවත්කාලීන කළ යුතුය.

4.4 **විදුලිබල පද්ධතියේ සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය ආශ්‍රිත විදුලිබලය.-**

* සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති සම්පත් යන්නට කුඩා පරිමාණ ජල විදුලිබලය, ශාක තාප තාක්ෂණ විදුලිබලය ඇතුළත් ජෛවස්කන්ධ, ජීව වායු හා අපද්‍රව්‍ය, සූර්ය බලශක්තිය හා සුළං බලය ඇතුළත් වේ. මේවා විදුලිබල පද්ධතිය වෙත විදුලිබල උත්පාදනය සිදු කෙරෙන ශ්‍රී ලංකාවේ ප්‍රවර්ධනය කරන ප්‍රධාන පෙලේ තිරසර, සාම්ප්‍රදායික නොවන ආකාරයේ පුනර්ජනනීය බලශක්ති වර්ගයන් වේ. මීට අමතරව, රළ තරංග බලශක්තිය හා සාගර තාප බලශක්තිය වැනි සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තීන්ද සුදුසු පරිදි ධෛර්යමත් කෙරේ.

* ග්‍රාමීය දුප්පත් ජනතාවට ඉන්ධන සඳහා දැව වගා කිරීමෙහි යෙදීමට හා ප්‍රධාන ආර්ථික ක්‍රියාවලින්වලට සහභාගිවීමට අවස්ථාව ලබාදීම තුළින් නාගරික අධික විදුලිබල ඉල්ලුම සැපයීම මගින් නව ග්‍රාමීය කර්මාන්තයක් ලෙස ජෛවස්කන්ධ වානිජමය වශයෙන් සංවර්ධනය කිරීම දිරිගැන්වීම හා ඒ සඳහා පහසුකම් සැපයීම කරනු ලැබේ.

* පවිත්‍ර සංවර්ධන යාන්ත්‍රණය වැනි හරිත මූල්‍ය සැපයුම් ප්‍රවේශයන් ඇතුළු පහසුකම් සැලසීමේ වැඩපිළිවෙලක් තුළින් සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිවලින් විදුලිබල පද්ධතියට සැපයෙන විදුලිබලය 10% ක අවම මට්ටමක් දක්වා ළඟා වීමට උත්සාහ දරනු ලැබේ. මෙම සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති සැපයුම් මට්ටමට පැමිණීමේ ඉලක්ක වර්ෂය 2015 වේ.

* විශේෂිත සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති තාක්ෂණයන් සඳහා අන්තර්කාලීන ඉලක්ක මිලකරණයේ ඉහළ සීමාවන් හා සම්පත් පිරිවැයකරණය දැක්වෙන පිරිවැය ප්‍රශස්ථ දීර්ඝකාලීන සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති සැළසුමක් සකස් කරනු ලැබේ. මෙම සැළසුම අවුරුදු 20 ක කාලයක් සඳහා වන අතර, අඩුතරමින් අවුරුදු දෙකකට වතාවක්වත් එය යාවත්කාලීන කරනු ලැබේ.

* සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය අවශෝෂණය කර ගැනීමේ තාක්ෂණික සීමාවන් හා මූල්‍යමය අවහිරතා සමාලෝචනය කරනු ලබන අතර ඉන් අනතුරුව අවශ්‍ය අවස්ථාවන්හි දී බාහිර සහයෝගය හා විශේෂඥ දැනුමද ලබා ගෙන තාක්ෂණික හා මූල්‍යමය බාධක ඉවත් කිරීමේ කටයුත්ත ද සිදු කරනු ලැබේ.

* සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති පිළිබඳ උපාය මාර්ග හේතුවෙන් පාරිභෝගික විදුලිබල ගාස්තුවලට කිසිඳු අතිරේක බරක් ඇති නොවේ. සාධාරණීකරණය කළහොත්, මේ කාර්යය සඳහා බලශක්ති උපයෝගිතා ආයතනවලට රජය විසින් සහනාධාර ලබා දෙනු ලැබේ.

* ජාතික සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ඉලක්කවලට දායක වීම සඳහා සමහර සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති තාක්ෂණවලට සිය ධාරිතාව ගොඩනැංවීම සහතික කිරීමට දිරිගැන්වීම් ලබා දිය යුතු බව රජය හඳුනාගෙන තිබේ. මෙම දිරිගැන්වීම් තරඟකාරී පදනමකින් ලබා දෙන අතර, එහිදී මිල උපරිමයකට යටත්ව සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති සංවර්ධනකරුවන් විසින් සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ඉලක්කයේ කොටසකට ඉල්ලුම් කළ යුතුය. සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති දිරිගැන්වීම් තාක්ෂණික විශේෂිත ඒවා වන අතර ඒවා විදුලිබල පද්ධතියට සැපයෙන තථ්‍ය බලශක්තිය මත පදනම් වේ.

* සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති තාක්ෂණයන් සඳහා දිරිගැන්වීම් ලබාදීමට රජය "බලශක්ති අරමුදලක්" ඇති කරනු ලබන අතර එය බලශක්ති සංරක්ෂණ අරමුදල මගින් කළමනාකරණය කෙරේ. බලශක්ති සෙස් බද්ද, ආධාර දෙන්නන් හා සුභ පතන්නන් විසින් දෙනු ලබන ප්‍රදාන මෙන්ම පවිත්‍ර සංවර්ධන යාන්ත්‍රණය යටතේ ලැබෙන අරමුදල්වලින් ද මෙම අරමුදල ශක්තිමත් කරනු ලැබේ. මෙම අරමුදල සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති තාක්ෂණයන් ප්‍රවර්ධනය සඳහා වන දිරිගැන්වීම් සැපයීමට හා සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති තාක්ෂණයන් විදුලිබල පද්ධතියට අවශෝෂණය කර ගැනීම සඳහා සම්ප්‍රේෂණ ජාලය ශක්තිමත් කිරීමට භාවිතා කරනු ලැබේ.

* වාණිජ කටයුතු ආරම්භ වූ දින සිට වසර 15 ක් ගත වනතුරු කිසිදු සම්පත් ගාස්තුවක් (රාජ්‍ය භාගයක්) සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති සංවර්ධනයන්ගෙන් අයකරනු නොලැබේ. වාණිජ කටයුතු ඇරඹී වසර 15 කට පසු තෝරාගත් සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිවලින් අය කෙරෙන සම්පත් ගාස්තුව බලශක්ති අරමුදල හරහා සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති තවදුරටත් සංවර්ධනය කිරීම ධෛර්යමත් කිරීමට භාවිතා කරනු ලැබේ.

ආයතනික වගකීම.- සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති උපායමාර්ග ක්‍රියාත්මක කිරීමේ හා ඉලක්ක සපුරාගැනීමේ ආයතනික වගකීම ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව හා බලශක්ති සංරක්ෂණ අරමුදල වෙත පැවරේ. මිල ප්‍රශස්ථ දීර්ඝකාලීන සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති සැළසුමක් බලශක්ති සංරක්ෂණ අරමුදල විසින් සකස් කරන අතර, එය ක්‍රියාත්මක කිරීම සඳහා දිරිගැන්වීම හා පහසුකම් සැපයීමද කරනු ඇත.

4.5 **විදුලිබල මිලකරණය.-**

* එක් එක් පාරිභෝගික කාණ්ඩයේ සාමාන්‍ය විදුලිබල මිල ක්‍රම ක්‍රමයෙන් පිරිවැය පිළිබිඹු වන ලෙසට සකස් කරනු ලැබේ. මෙම වෙනස්වීම හේතුවෙන් ඇති වන ඉල්ලුම් පාර්ශ්වයේ කළමනාකරණ අවස්ථා සම්පූර්ණයෙන් ප්‍රයෝජනයට ගැනීම සඳහා යෝග්‍ය පරිසරයක් නිර්මාණය කරනු ලැබේ.

* ගෘහස්ත පාරිභෝගිකයන් සඳහා වන සහනශීලී ජීවන විදුලිබල ගාස්තු ක්‍රමය සමෘද්ධි ප්‍රතිලාභීන් හට සීමා වන අතර එය මාසික ගෘහස්ත පාරිභෝජනය කිලෝ වොට් පැය 30 කට සීමා කරනු ලැබේ. සැපයුම් පිරිවැයෙන් 50% ක් ලෙස ඇස්තමේන්තුගත කර ඇති අදාළ සහනාධාර ප්‍රමාණය රජයේ ප්‍රදාන මගින් සම්පූර්ණයෙන් සපයනු ලැබේ.

* තොග මිලදී ගැනීම්වලදී විදුලිබල උත්පාදන මිල ගණන් විදුලිබල මිලදී ගැනීමේ ගිවිසුම්වල දක්වා ඇති ආකාරයෙන් වන අතර පාරිභෝගිකයින් හා විදුලිබල උපයෝගිතා ආයතන යන දෙපාර්ශ්වයටම සාධාරණත්වය ඉටුවන බව සහතික වන පරිදි සම්ප්‍රේෂණ, බෙදාහැරීම් හා සැපයුම් ගාස්තු නියාමනය කරනු ලැබේ. පාරිභෝගිකයන්ට හා අනෙක් සියලුම කොටස්කරුවන්ට මහජන අදහස් විමසීමකදී සිය අදහස් දැක්වීම් ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දෙනු ලැබේ.

ආයතනික වගකීම.- විදුලිබල මිලකරණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ ආයතනික වගකීම විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශ, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව, විදුලිබල උපයෝගිතා ආයතන හා මහා භාණ්ඩාගාරය වෙත පැවරේ. විදුලිබලය බෙදාහැරීමේ ආයතන විසින් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා විදුලිබල ගාස්තු යෝජනා සකස් කරන අතර රජයේ සහනාධාර සඳහා මහා භාණ්ඩාගාරයේ එකඟතාවය ලබා ගැනීමට කොමිෂන් සභාව කටයුතු කරනු ඇත.

4.6 **ඛණිජ තෙල් උප අංශ නියාමනය හා නිෂ්පාදන මිලකරණය.-**

ඛණිජතෙල් ආශ්‍රිත ඉන්ධනවල මිල රජය හා ඛණිජතෙල් උප අංශ උපයෝගිතා ආයතන අතර එකඟ වූ මිල සූත්‍රයක් අනුව තීරණය කරනු ලබන අතර එය ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව මගින් නියාමනය කෙරේ. තරඟකාරී නොවූ පරිසරයක අලෙවි වන ඛණිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා පමණක් මෙම මිල නියාමනය අදාළ වේ. ඛණිජතෙල් නිෂ්පාදන ආනයනය හා ඒවායේ දීප ව්‍යාප්ත බෙදාහැරීම පොදු භාවිත පහසුකම් ආයතනයක් මගින් සිදු කරනු ලබන අතර එය ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව මගින් නියාමනය කරනු ලැබේ. වෙනත් කිසිදු නිෂ්පාදනයකට සාමාන්‍ය සහනාධාර ලබා නොදෙන අතර අදාළ කාලයක් තුළ නියම කළ උපරිම සිල්ලර පාරිභෝගික මිල ගණන් තුළ සිය සිල්ලර පාරිභෝගික මිල තීරණය කිරීමට අලෙවි සමාගම්වලට ඉඩ දෙනු ලැබේ. භූමිතෙල් භාවිතය සඳහා අඩු ආදායම්ලාභී පවුල්වලට (සමෘද්ධිලාභීන්ට) ඉලක්කගත සහනාධාර ලබා දෙනු ලැබේ. අනෙකුත් ඛණිජතෙල් ආශ්‍රිත ඉන්ධන සඳහා වන සහනාධාර 2007 වර්ෂය වන විට ඉවත් කරනු ලැබේ.

ආයතනික වගකීම.- මෙම සියලු පියවර ක්‍රියාත්මක කිරීමේ ආයතනික වගකීම ඛණිජතෙල් හා ඛණිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව, ඛණිජ තෙල් උප අංශ උපයෝගිතා ආයතන හා මහා භාණ්ඩාගාරය වෙත පැවරී තිබේ. එකඟ වූ සූත්‍රයකට අනුව ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා මිල යෝජනා සකස් කිරීම ඛණිජතෙල් බෙදාහරින්නන් විසින් සිදු කරන අතර, රජයේ සහනාධාරය සඳහා මහා භාණ්ඩාගාරයේ එකඟතාවය ලබා ගැනීම කොමිෂන් සභාව විසින් කරනු ඇත.

4.7 **ඛණිජතෙල් හා වායු ගවේෂණය.-**

මන්නාරම් බොක්කේ අංග සම්පූර්ණ භූ කම්පන විස්තර ලබා ගැනීම 2005 වර්ෂයේ මැද භාගයේදී සිදු කරන ලදී. ගවේෂණය සඳහා බිම් කොටස්වලට බලපත්‍ර ලබා දීමේ පළමු වටයේ නිවේදනය 2006 වර්ෂයේ මැද භාගයේදී සිදු කෙරේ. කාවේරි නිම්නයේ සහ දකුණු ප්‍රදේශයේ වඩාත් සවිස්තර ද්විමාන හා ත්‍රිමාන භූ කම්පන පරීක්ෂාවන් 2006/2007 වර්ෂවලදී කරනු ලැබේ.

ආයතනික වගකීම.- ජාත්‍යන්තර වශයෙන් පිළිගත් පරිචයන් හා සාධනය කළ තාක්ෂණය අනුගමනය කරමින් සුදුසු ආයෝජකයන්ගේ සහභාගිත්වය ඇතිව ඛණිජතෙල් සම්පත් ගවේෂණය හා ප්‍රයෝජනයට ගැනීම පිළිබඳ සියලු පියවර ගැනීම සහතික කෙරෙන ආයතනික වගකීම ඛණිජතෙල් හා ඛණිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය වෙත පැවරේ.

4.8 **නැව්තෙල් සැපයීම-**

ශ්‍රී ලංකාවේ උපායමාර්ගික පිහිටීම අනුව එය දකුණු ආසියාවේ නැව් තෙල් සැපයීමේ ඉතාමත් හිතකර ස්ථානයක පිහිටා තිබේ. මෙම කර්මාන්තය නිදහස් ලෙස පවත්වාගෙන යාමට දැනටමත් ක්‍රියාමාර්ග ගෙන ඇති නමුත්, යම් බාධාවන් හේතුවෙන් ආයෝජකයන් ආකර්ශනය කර ගැනීමට එය අපොහොසත් වී තිබේ. එම සියලු බාධාවන් ඉවත් කර මෙය ශ්‍රී ලංකාවේ ප්‍රධාන කර්මාන්තයක් බවට පත් කිරීමට මෙම කර්මාන්තයේ නියැළී සිටින ලෝකයේ සියලු ප්‍රධාන ක්‍රියාකාරිකයින්ගේ දායකත්වය ලබා ගැනීම සහතික කරන සමානාත්මතාවයක් ඇති කිරීම සඳහා ඉක්මන් ක්‍රියාමාර්ග ගනු ලැබේ. මෙම කර්මාන්තය නිදහස් ලෙස පවත්වාගෙන යාමට ඉඩදීමේ ක්‍රියාවලිය 2007 වර්ෂය අවසානයේදී සම්පූර්ණ කරනු ලැබේ.

ආයතනික වගකීම.- මෙය ක්‍රියාත්මක කිරීමේ ආයතනික වගකීම ඛණිජ තෙල් හා ඛණිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය, මුදල් අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත පැවරේ.

4.9 **සැපයුම් පාර්ශ්වයේ බලශක්ති කාර්යක්ෂමතාවය-**

* විදුලිබල උප අංශයේ සම්ප්‍රේෂණයේ හා බෙදා හැරීමේ බලශක්ති හානි (තාක්ෂණික හා වාණිජ හානිවල එකතුව) 2009 වර්ෂය අවසානය වන විට උපරිම වශයෙන් 13.5% ක් දක්වා ක්‍රම ක්‍රමයෙන් අඩු කරනු ලැබේ. හානි අවම කිරීමේ ක්‍රියාවලිය වේගවත්ව ක්‍රියාත්මක කිරීමටත් මෙම අපේක්ෂාවන් ඉක්මවා යෑමටත් අවශ්‍ය සෑම උත්සාහයක්ම දරනු ලැබේ.

* ජලවිදුලි බල පද්ධතියෙන් උපරිම බලශක්ති නිෂ්පාදනයක් සහතික කිරීම සඳහා 2007 වර්ෂය අවසානය වන විට ඒකාබද්ධ ජල-තාප විදුලිබල පද්ධතිය ප්‍රශස්ථ ක්‍රියාකාරිත්වයට ගෙන ඒම සඳහා වන වර්තමාන විදුලිබල පද්ධති පාලන කාර්ය පටිපාටිය වැඩිදියුණු කරනු ලැබේ.

* නිශ්චිත විදුලිබල පද්ධති උපාංගවලට ඇතුල්වන හා ඒවායින් පිටවන බලශක්තිය නොකඩවා මැනීමෙන් එකතු කරගන්නා තොරතුරු මගින් මෙහෙයවනු ලබන, විදුලිබල උත්පාදනය, සම්ප්‍රේෂණය හා බෙදාහැරීම සඳහා ජාතික අවශ්‍යතාවයක් ලෙස සළකා දැනුවත් පුනරුත්ථාපන/නව ආයෝජන තීරණ ගනු ලැබේ.

ආයතනික වගකීම.- මෙම උපායමාර්ගය ක්‍රියාත්මක කිරීමේ සහ ඉලක්ක සපුරා ගැනීමේ ආයතනික වගකීම විදුලිබල උපයෝගීතා ආයතන හා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙත පැවරේ.

4.10 **ඉල්ලුම් පාර්ශ්වයේ බලශක්ති කාර්යක්ෂමතාවය-**

* පාරිභෝගිකයන්ට දැනුවත් මිලදී ගැනීමේ තීරණ ගැනීමට ඉඩ සලසමින්, 2010 වර්ෂය අවසානය වන විට, විදුලිබල ඉල්ලුමට මූලික වශයෙන් දායක වන සියලු විදුලි උපකරණ හඳුනාගෙන බලශක්ති කාර්යක්ෂමතාවය අනුව ඒවා ලේබල් කරනු ලැබේ. භාණ්ඩයක් මිලට ගැනීමේ වියදමට වඩා එහි ආයු කාලයේ වියදම කෙරෙහි වැඩි අවධාරණයක් යොමු කිරීමට භාණ්ඩ ලේබල් කිරීම භාවිතා කෙරෙන අතර එමගින්, විශේෂයෙන්ම භාණ්ඩ ආනයන බදු තීරණය කිරීමේ දී අදාළ වන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය හසුරුවනු ඇත.

* කාර්යක්ෂම තාක්ෂණයන් හඳුන්වා දීමටත්, අකාර්යක්ෂම උපකරණ ආනයනය කිරීම හා නිෂ්පාදනය කිරීම ක්‍රම ක්‍රමයෙන් අඩු කිරීමටත්, ලේබල් කිරීමේ වැඩසටහනේ අඛණ්ඩ ශෝධනයේ ප්‍රතිඵල භාවිතා කරනු ලැබේ. 2007 වර්ෂයේ මැද වන විට හඳුනාගත් භාණ්ඩ සඳහා ලේබල් කිරීමේ වැඩසටහන අනිවාර්ය කරනු ලැබේ.

* පෞද්ගලික හා රාජ්‍ය අංශවල බලශක්ති සේවා සපයන්නන්ගේ ධාරිතාවය තව දුරටත් සංවර්ධනය කිරීම මගින් බලශක්ති කාර්යක්ෂමතා සේවාවන්හි සැපයීම කඩිනම් කරනු ලැබේ. මිල අධික උපකරණ ණය පදනම මත සැපයීම හා දේශීය තත්ත්වයන්ට අදාළ විශ්ලේෂණාත්මක තොරතුරු සැපයීම ආදියෙන් බලශක්ති කාර්යක්ෂමතා සේවා සැපයීමට ප්‍රවේශ වන නව ප්‍රවේශකයන් ධෛර්යමත් කෙරෙන අතර ඔවුනට ඒ සඳහා අවශ්‍ය සහාය ලබා දෙනු ලැබේ.

* 2007 වර්ෂයේ අවසානය වන විට නිශ්චිත කර්මාන්තවලට බලශක්ති සූක්ෂමතාවය පිළිබඳ වන සීමා සළකුණු ස්ථාපිත කරනු ලැබේ. 2008 වර්ෂයේ අවසානය වන විට වාණිජ, ප්‍රවාහන හා ගෘහස්ත අංශවල පරිභෝජනයන් සඳහා වන නිශ්චිත සීමා සලකුණු ස්ථාපිත කරනු ලැබේ.

* 2007 වර්ෂය අවසන් වන විට වඩා සවිස්තරව හා පැහැදිලි ඉල්ලුම් පාර්ශ්වයේ දත්ත සහිතව ජාතික බලශක්ති දත්ත පදනම පුළුල් කරනු ලැබේ.

* සියලු අංශවල බලශක්ති කාර්යක්ෂමතා ප්‍රවර්ධන ව්‍යාපෘතිවලට අරමුදල් සැපයීමට 2007 වර්ෂය අවසානය වන විට විවිධ මුල්‍යකරණ යාන්ත්‍රණයන් ඇති කරනු ලැබේ. ණය වැඩිකිරීමේ පහසුකම්ද මෙයට ඇතුලත් වේ. බලශක්ති කාර්යක්ෂමතා ප්‍රවර්ධන අරමුදල් සැපයීම ණය විස්තරවල එක් සම්මත අයිතමයක් සේ සැලකීම සඳහා මුල්‍ය ආයතනවල ධාරිතාවය සංවර්ධනය කෙරෙන අතර ඒ සඳහා අවශ්‍ය සහාය ලබා දෙනු ලැබේ.

* ප්‍රධාන බලශක්ති පාරිභෝගිකයන් ලෙස හඳුනාගත් රාජ්‍ය අංශයේ ආයතන සමීපව අධීක්ෂණය කරන අතර, ඔවුන්ගේ බලශක්ති වියදම බලශක්ති කාර්යක්ෂමතා ප්‍රවර්ධනය හා වියදම් පාලනය සඳහා සහාය වීමට පුනරාවර්තන වියදම්වලින් වෙන් කරනු ලැබේ. එවැනි ආයතනවලට බලශක්ති කාර්යක්ෂමතා උපකරණ මිලට ගැනීම අනිවාර්ය කරනු ලැබේ.

* වීදි ලාම්පු පාලනයකින් තොරව සවිකිරීමේ වර්ධනය අවම කිරීමට හා ඒවා කාර්යක්ෂම ලෙස භාවිතය ප්‍රවර්ධනය කිරීමට 2008 වර්ෂය වන විට වීදි ලාම්පු පිළිබඳ ප්‍රතිපත්ති සංග්‍රහයක් හඳුන්වා දෙනු ලැබේ.

* ගොඩනැගිලි පිළිබඳ බලශක්ති කාර්යක්ෂමතා නීති සංග්‍රහය යාවත්කාලීන කරනු ලබන අතර 2007 වර්ෂය අවසන් වන විට රාජ්‍ය අංශයේ ආයතනවලට එය අනිවාර්ය කරනු ලැබේ. එම කාලය තුළම අනෙකුත් ආයතන නීති සංග්‍රහය භාවිතා කිරීම ධෛර්යමත් කිරීම සඳහා අවසරපත් නිකුත් කිරීමේ ආයතන හරහා වක්‍ර ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරනු ලැබේ.

* බලශක්ති කාර්යක්ෂමතාව වැඩි කරන ආකාරය පිළිබඳ තොරතුරු එකතු කර, පාරිභෝගිකයන්ට බලශක්ති කාර්යක්ෂමතා ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැළසෙන පරිදි ජන මාධ්‍ය හා අනෙකුත් සුදුසු නාළිකා මගින් ප්‍රචාරය කරනු ලැබේ.

ආයතනික වගකීම.- විස්තර කොට ඇති ඉලක්ක කරා ළඟා වීමේ මෙම උපායමාර්ග ක්‍රියාත්මක කිරීමේ ආයතනික වගකීම බලශක්ති සංරක්ෂණ අරමුදල වෙත පැවරී ඇති අතර, එයට විදුලිබල හා ඛණිජ තෙල් උපයෝගිතා ආයතන, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව හා වෙනත් කොටස්කරුවන් සහාය ලබා දෙනු ඇත.

4.11 **ජාතික බලශක්ති දත්ත පදනම හා ඒකාබද්ධ ජාතික බලශක්ති සැලසුම්කරණය.-**

* ප්‍රතිපත්තිමය ගැටළුවලට විසඳුම් ලබා දීමට, උප අංශ අතර අන්තර් සම්බන්ධතාවය ඇති කිරීමට හා රාජ්‍ය, පෞද්ගලික හා සිවිල් සමාජ කණ්ඩායම්වල අදහස් විමසා මිලකරණ ප්‍රතිපත්ති වැනි වැදගත් කරුණු පිළිබඳව සොයා බැලීමට විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය විසින් වහාම ජාතික බලශක්ති සැලසුම් කණ්ඩායමක් පිහිටුවනු ලැබේ.

* බලශක්ති අංශයේ කාර්ය සාධනය පිළිබඳ සියලු අංශයන් සම්බන්ධයෙන් විශ්ලේෂණය කිරීම හා නිශ්චිත නිර්දේශයන් ලබා දීම සඳහා ප්‍රමාණවත් බලතල 2007 වර්ෂය වන විට මෙම සැලසුම් කණ්ඩායම වෙත පවරනු ලැබේ. ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මෙම කණ්ඩායමට අවශ්‍ය සහාය ලබා දෙනු ලැබේ.

* අවශ්‍ය වුවහොත්, ඉල්ලුම් අනාවැකි සංවර්ධනය කිරීමට, සංවර්ධන සංදර්භයන් සැකසීමට, උප අංශ සැලසුම් ඒකාබද්ධ කිරීමට, සංවේදිතාවය පිළිබඳ අධ්‍යයනයන් සිදු කිරීමට, ප්‍රතිපත්ති විකල්ප විශ්ලේෂණය කිරීමට හා ඒකාබද්ධ ජාතික බලශක්ති සැළැස්මක් සංවර්ධනයට සැලසුම් කණ්ඩායම විසින් 2007 වර්ෂය අවසන් වන විට වැඩිදියුණු කරන ලද ක්‍රමවේදයක් ස්ථාපිත කරනු ලැබේ.

* සෑම වර්ෂයකම, ජාතික බලශක්ති දත්ත පදනම හා පාරිසරික පිටකිරීම් ද ඇතුළුව බලශක්ති අංශයේ කාර්ය සාධන විශ්ලේෂණය යාවත්කාලීක කර ප්‍රකාශයට පත් කරනු ලැබේ. මෙහි සාරාංශ තොරතුරු වෙබ් අඩවියක දැක්වෙන අතර සවිස්තර තොරතුරු ඉල්ලීමක් කිරීමෙන් ලබා ගත හැකිය. 2004 වර්ෂය දක්වා යාවත්කාලීන කරන ලද පළමු බලශක්ති දත්ත පිළිබඳ ප්‍රකාශනය 2006 වර්ෂය අවසානය වන විට ප්‍රකාශයට පත් කරනු ලැබේ.

* බලශක්ති සංවර්ධනය හා උපදේශක සේවා සැපයීම සඳහා පළාත් සභාවල හැකියාව ඒකාබද්ධ ජාතික බලශක්ති සැළැස්මට අනුව සංවර්ධනය කරනු ලැබේ.

ක්‍රියාත්මක කිරීමේ වගකීම.- විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ජාතික බලශක්ති සැලසුම් කණ්ඩායම විසින් අනාගත වසර 25 ක් සඳහා ඒකාබද්ධ ජාතික බලශක්ති සැළැස්මක් පිළියෙල කරනු ලබන අතර එය අඩුම වශයෙන් සෑම වර්ෂ

දෙකකට වරක්ම ප්‍රකාශයට පත් කරනු ලැබේ. ජාතික බලශක්ති තුලිතය හා බලශක්ති අංශයේ කාර්ය සාධනය වාර්ෂිකව ප්‍රකාශයට පත් කරනු ලැබේ.

4.12 **ගැමි විදුලියනය (ග්‍රාමීය ප්‍රදේශවලට විදුලිබලය සැපයීම)-**

ගැමි විදුලියන වැඩසටහන්වලට අරමුදල් සැපයීම සඳහා විශේෂ අරමුදලක් ආරම්භ කරනු ලැබේ. මෙම අරමුදලේ ප්‍රධාන ප්‍රභවයන් වන්නේ සියලු ආධාර අරමුදල්, රජයේ දායකවීම් සහ අනාගත විදුලිබල බෙදාහැරීමේ උපයෝගීතා ආයතන(ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව විසින් තීරණය කරන පරිදි) විසින් ලබාදෙන දායක මුදල්ය. ගැමි විදුලියන වැඩසටහන් ආශ්‍රිතව මේ දක්වා අනුගමනය කෙරෙන පරිචයන් සමීපව පරීක්ෂා කරනු ලැබේ. මෙහිදී අනෙකුත් සංවර්ධනය වෙමින් පවතින රටවල් විසින් අනුගමනය කරනු ලබන ප්‍රතිපත්ති/වැඩසටහන් රජය විසින් අධ්‍යයනය කරනු ලබයි. එසේම සමහර සංවර්ධනය වන රටවල් විසින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර ඇති ප්‍රතිපත්තියක් වන ගැමි විදුලියන යෝජනා ක්‍රමයන්හි කළමනාකරණය පාරිභෝගික සමුපකාර සමිති වෙත පැවරීම පිළිබඳව දැඩි ලෙස සළකා බලනු ලැබේ.

ආයතනික වගකීම.- මෙය ක්‍රියාත්මක කිරීමේ ආයතනික වගකීම විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය හා මුදල් අමාත්‍යාංශය වෙත පැවරෙන අතර, එයට ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ සහාය ලැබේ.

සටහන.- බලශක්ති සංරක්ෂණ අරමුදල වෙත පැවරෙන ආයතනික වගකීම් යෝජිත "සුනිත්‍ය බලශක්ති අධිකාරිය (Sustainable Energy Authority)" ස්ථාපිත කළ පසු එම අධිකාරිය වෙත පවරනු ලැබේ.

06-466

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.